**01 S**

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2569 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2024 (2025)

## (01) බුද්ධ චරිතය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) බ්‍රාහ්මණයන්ට දැනුම ලබාගත යුතු යැයි පිළිගැනෙන චතුර්වේදය ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(ii) බ්‍රාහ්මණ සමාජ සංවිධානය තුළ පඤ්චම කුලයට අයත් යැයි සැලකෙන කුල හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රාහ්මණ සමාජය තුළ ශුද්‍රයන්ට අහිමි වූ මූලික අයිතිවාසිකම්වලට අදාළ ක්ෂේත්‍ර තුනක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(iv) බුද්ධකාලීන භාරතීය ආගමික පසුබිම සහ සමාජ පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

2. (i) බුද්ධකාලීන භාරතීය ආර්ථික ක්‍රියාවලිය සාකච්ඡා කළ හැකි ප්‍රධාන සිරස්තල හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) බුද්ධකාලීන භාරතයේ පැවති අතුරු භෝග වගාවන් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) බුද්ධකාලීන භාරතය තුළ ගව පාලනය දියුණු ආර්ථික සාධකයක් වූ බවට කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය ඇති කිරීමෙහිලා භාරතීය අර්ථක්‍රමයෙන් ගත හැකි ආදර්ශ සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

3. (i) බුද්ධකාලීන භාරතයේ පැවති රාජාණ්ඩු හතරෙහි පාලනය මෙහෙය වූ රජවරුන් හතරදෙනකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) එම රාජාණ්ඩු අතර කෝසල ජනපදයෙහි විශේෂතා හතරක් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(iii) රාජාණ්ඩු පාලන ක්‍රමයෙහි මූලික ලක්ෂණ කරුණු තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) බුද්ධ චරිතයට සම්බන්ධ වැදගත් සිදුවීම් සිදු වූ රාජාණ්ඩු දෙකක් නම් කොට, ඒවායෙහි බුද්ධ චරිතයේ සම්බන්ධතාව සිදුවීම් දෙකක් ඇසුරින් දක්වන්න. (ලකුණු 06 යි)

### II කොටස

4. (i) සිද්ධාර්ථ කුමරුට පළමුවර නමස්කාර කළ දෙදෙනා නම්කර, ඔවුන් ලබා තිබූ ආධ්‍යාත්මික තත්ත්වයන් හා තනතුරු ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(ii) සර්වමිත්‍ර ඇතුළු ආචාර්යවරයා වෙතින් සිද්ධාර්ථ කුමරුන් හැදෑරූ ශිල්ප ශාස්ත්‍ර හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ශුද්ධෝදන රජතුමා සිද්ධාර්ථ කුමරු ගැන තබා තිබූ බලාපොරොත්තුව ලියා දක්වා එය ඉටුකරගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

(iv) උයන් කෙළි නිමවා පැමිණෙන සිද්ධාර්ථ කුමාරයා දැක කිසාගෝතමිය සිදු කළ නිවීමේ සුවය ගැන වූ ප්‍රකාශය ගෙනහැර දක්වා එහි අදහස කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

[ 2 වැනි පිටුව බලන්න

CamScanner

5. (i) සිදුහත් බෝසතුන් බුදුවීමට පෙර මර්දනය කළ අකුසල විතර්ක අතුරින් දෙකක් සහ වර්ධනය කළ කුසල විතර්ක අතුරින් දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අර්හත් මාර්ගඥානයත් සමග සාක්ෂාත් කළ බුද්ධඥාන හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුදුරජාණන් වහන්සේ ගතකළ සත් සතිය ගෙනහැර දක්වා ඉන් ලෝකයට ලබාදෙන ආදර්ශ පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iv) බුදුරදුන් අවබෝධ කළ දුක්ඛ ආර්ය සත්‍යයට ඇතුළත් දුක කෙටියෙන් විවරණය කරන්න. (ලකුණු 06 යි)

6. (i) ලෝකවාසී මනුෂ්‍යයාට නිරතුරුව මුහුණදීමට සිදුවන අටලෝදහම් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුද්ධ චරිතය තුළින් ප්‍රකට වන උදාර මානව ගුණාංග හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) අටලෝදහමින් කම්පා නොවීමේ බුදුරදුන්ගේ තාදී ගුණය ප්‍රකට කළ අවස්ථා තුනක් උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iv) සමාජ ශෝධකයකු ලෙස බුදුරදුන් සමාජය තුළ උදාර මානව ගුණාංග ප්‍රකට කළ අවස්ථා තුනක් උදාහරණ ඇසුරින් විමසන්න. (ලකුණු 06 යි)

## III කොටස

7. (i) බුදුරදුන් තුළ පැවති චතුර්යෝනි පරිච්ඡේදක ඥානයට අයත් වර්ග හතර නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුරදුන් තුළ පැවති පංචගති පරිච්ඡේදක ඥානයට අයත් ගති හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) "බුදුරජාණන් වහන්සේ උත්තම චරණධර්මයන්ගෙන් යුක්ත වූ සේක." මෙහි සඳහන් චරණධර්ම යන්න හඳුන්වා හිරි-ඔත්තප්ප දෙක කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(iv) "චතුරංග සමන්නාගත වීර්යයෙන් යුක්තව බුද්ධත්වය ලැබූ බුදුරජාණන් වහන්සේ සර්වඥතාඥානයෙන් ද යුක්ත වූහ." ඉහත ප්‍රකාශයෙහි 'වීර්ය හා සර්වඥතාඥානය' ඇසුරින් ලෝකයට සපයන ආදර්ශ ගෙනහැර දක්වන්න. (ලකුණු 06 යි)

8. (i) භික්ෂු ශාසනය තුළ විනය නීති පැනවීමෙහිලා බලපෑ හේතු සාධක (ආසවට්ඨානීය ධර්ම) හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) දේවදත්ත තෙර බුදුරදුන් වෙත ඉදිරිපත් කළ වත හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පූර්වාරාමයේදී ප්‍රාතිමෝක්ෂ දේශනාවට සූදානම් වූ බුදුරදුන්ට පෙනී ගිය භික්ෂු සංඝයාගේ අපිරිසිදුභාවය විෂයයෙහි මුගලන් තෙරුන්ගේ මැදිහත්වීම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) දෙව්දත් තෙර විසින් බැහැර කරන ලද ගැබිනියක වූ කුමාරකාශ්‍යප මාතාවගේ නිර්දෝෂීභාවය හඳුනාගැනීමෙහිලා අනුගමනය කළ ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) සම්බුද්ධ සසුනෙහි ප්‍රඥාලාභීන් අතුරින් හා සෘද්ධිමතුන් අතුරින් අගතනතුරු ලැබූ ශ්‍රාවක-ශ්‍රාවිකාවන් සිව්දෙනකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) එම ශ්‍රාවක-ශ්‍රාවිකාවන් අග්‍රස්ථානයට පත්කරලීමෙහිලා හේතු වූ කරුණු වෙන වෙනම දක්වන්න. (ලකුණු 04 යි)

(iii) අග්‍ර උපස්ථායක ආනන්ද තෙරුන්ගේ චරිතය කෙටියෙන් දක්වා උපස්ථායකයකු ලෙස උන්වහන්සේ සමාජයට ලබාදෙන ආදර්ශ පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iv) භද්දකච්චානා තෙරණියගේ චරිතය කෙටියෙන් දක්වා ගිහිකල ඇය යහපත් බිරිඳක ලෙස වර්තමාන සමාජයේ භාර්යාවන් වෙත සපයන ආදර්ශ ප්‍රකාශ කරන්න. (ලකුණු 06 යි)

10. (i) බුදුරදුන්ගේ පළමු ධර්මදේශනය අසා සෝවාන් ඵලයට පත් මුල්ම ශ්‍රාවකයන් වහන්සේලා හතරදෙනා නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුසසුනේ උපාසකභාවයට පත් බුද්ධකාලීන සහෝදරවරුන් දෙදෙනකු හා උපාසිකා බවට පත් සිටු දේවියන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) බුද්ධකාලීන උපාසක-උපාසිකාවන් දෙපළකගේ ශාසනික සේවාව අගයන්න. (ලකුණු 06 යි)

(iv) ඉලෙක්ට්‍රොනික හා තාක්ෂණික උපකරණ භාවිතයෙන් නූතන ළමා පරපුර ඇතිකොට ඇති නරක බලපෑම් මග හැරීමෙහිලා ඔබ යෝජනා කරන ගිහි විනයට අනුගත ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

CS CamScanner